පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 07

විෂයය :- ක්‍රිස්තියානි ධර්මය 1-11

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2යි

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

01) මැවිල්ල තුළ ප්‍රධාන තැන හිමි වන්නේ ,
i.ගස්වැල් වලටය .
ii.මිනිසාටය.
iii.අහස හා පොළවටය.

02) චක්‍රාකාර දේව නිමවුමකි
i.දිවා රෑ ඇති වීම.
ii.සතුන් ඇවිදීම.
iii.වළාකුළු තිබීම.

03) දෙවිඳුන්ගේ ස්ථිර ප්‍රේමය තුළින් ලැබෙනුයේ,
i.වංක බවය.
ii.නිරෝගී දිවියකි.
iii.අනුකම්පාවෙන් තොර දිවියකි.

04) ජෝබ් 28:28 ට අනුව දේව ගරුබිය පෑම යනු,
i.උපකාර කිරිමයි.
ii.දේවස්ථානයට යෑම පමණය.
iii.ප්‍රඥාවේ උල්පතයි.

05) ස්නාවක ජොහාන් තුමා ආහාරයට ගන්නේ ,
i.පළගැටියන් හා වන මී ය.
ii.මන්නා ය.
iii.රොටි හා මළුය.

06) ජේසුස් වහන්සේ ඉගැන්වීම සඳහා යොදගනු ලැබුයේ ,
i.නාගරික පරිසරය.
ii.වනාන්තරය.
iii.කඳු මුදුන්ය.

07) ගෙත්සමයේ යාච්ඤාව අවස්ථාවේ ජේසුස් වහන්සේ සමග සිටි ගෝලයන් වන්නේ,

i.ලෙවි,ජුදස්, තෝමස් .
ii.ඇන්ඩෘ,පේදුරු,මතෙව්.
iii.පේදුරු,ජාකොබ්,ජොහාන්.

08) ජේසුස් වහන්සේ කුරුසියේදි පැවසූ පළමුවන වචනය වන්නේ,

i. ස්ත්‍රිය ,මෙන්න ඔබේ පුත්‍රයා ,මෙන්න ඔබේ මෑණියෝ.
ii. පියාණෙනි ඔවුන්ට කමා වුව මැනව , ඔවුන් කරන දේ ඔවුහු නොදනිති.
iii.සියල්ල නිම විය.

09) උත්ථාන වූ ජේසුස් වහන්සේ දකීමෙන් ස්පර්ෂ කිරීමෙන් පමණක් විශ්වාස කළ ශ්‍රාවකයා වන්නේ,

i.පේදුරුය.
ii.තෝමස්ය.
iii.ජෝහාන්ය.

10)පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය සිදුවූ ස්ථානය වන්නේ ,

i.ජෙරුසලමේ ගෙයක දි ය.
ii.බෙත්ලෙහෙමේ ගෙයක දි ය.
iii.කානාන්හි දි ය.

- **පහත පාඨවල හිස්තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.**

11) එහෙයින් යමෙක් මාගේ ඒවා පිළිපදිද,ඔහු ........................................මත ගෙය තැනූ නැණවතෙකුට සාමානය .

12) මා සමඟ ප්‍රීති වන්න මාගේ නැති වූ ....................................................සම්බ වී යයි ඔවුන්ට කිය.

13) එහෙත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යයද, .................................................... ද සොයන්න.

14) උන්වහන්සේ නොදුටු නමුත් ඇදහූ බැවින් .................................................... වේ .

15)මා නුඹට කී .................................................... පොතක ලියන්න .

**( බැටළුවා ,වචන , පර්වතය, භාග්‍යවන්තයකු, ධර්මිෂ්ඨකම)**

- **A තිරුවේ සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු B තිරුවෙන් තෝරා යා කරන්න.**

| A | B |
| --- | --- |
| **16)** බැටළුවන් යනුවෙන් හඳුන්වන්නේ , | පොත්ය. |
| 17) දේව රාජ්‍යයට අයිතිවාසිකම් ලබන්නේ, | ත්‍රිපිටකයයි. |
| 18) **බිබිලියා** යන්නෙහි අරුත වන්නේ , | කුරානය. |
| 19) බුදු දහමේ ප්‍රධාන ග්‍රන්ථය වන්නේ | ළදරුවන්ය. |
| 20) ඉස්ලාම් ආගමේ ප්‍රධාන ග්‍රන්ථය වන්නේ | කිතුනුවන්ය. |

( ලකුණු 2 ×20 =40)

## II. කොටස

**ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01) i. මැවිල්ල කෙරෙහි මිනිසාට පැවරී තිබෙන වගකීම් **දෙකක්** ලියන්න. (ලකුණු 04)

ii. මැවිල්ල විනාශවන මිනිස් ක්‍රියා **දෙකක්** ලියන්න. (ලකුණු 04)

iii. මැවිල්ල දූෂණය වීම වැළැක්වීම සඳහා පාසල් සිසුවෙකු ලෙස ඔබට කළ හැකි දේවල් **තුනක්** විස්තරාත්මකව ලියන්න. (ලකුණු 06)

02) i. ස්නාවක ජොහාන්තුමාගේ දෙමාපියන් කවුද? (ලකුණු 02)

ii ස්නාවක ජොහන්තුමා මිනිසුන්ට ආරාධනා කළේ කුමක් සඳහා ද? (ලකුණු 04)

iii. ස්නාවක ජොහන්තුමාගේ මනස්ථාපනයේ දූත මෙහෙවර මගින් අපට ලැබෙන ආදර්ශ කරුණු තුනකින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03) i.හාස්කම්වලින් ජේසුස් වහන්සේගේ බලය පෙන්වන ලෙස බලපෑම් කළ පරික්ෂාවක් ලියන්න.

(ලකුණු 02)

ii.එම පරික්ෂාවට උන්වහන්සේ දුන් පිළිතුර ලියා දක්වන්න.

(ලකුණු 04)

iii. ඔබට පැමිණෙන පරික්ෂා හා ගැටළු සඳහා දේව දරුවකු ලෙස මුහුන දෙන අයුරු කරුණු **තුනකින්** ලියන්න.

(ලකුණු 06)

04) i. ජේසුස් වහන්සේ ජීවත් වු සමාජයේ පිළිගැනිමට ලක් නොවු සමාජ කණ්ඩායම් **දෙකක්** ලියන්න. (ලකුණු 02)

ii.ජේසුස් වහන්සේ දරුවන් අගය කරමින් කරන ලද ප්‍රකාශයක් ලියන්න.

(ලකුණු 04)

iii.ඔබේ පන්තියේ කොන් වු අයකු (නොපිළිගැනිමට ලක් වු) වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් **තුනක්** විස්තර කරන්න.

(ලකුණු 06)

05) i.ශ්‍රාවකයන්ගේ පාද සේදිම තුළින් ජේසුස් වහන්සේ පෙන්වා දුන් ආදර්ශයන් **දෙකක්** ලියන්න.

( ලකුණු 02)

ii.එදිනෙදා ජිවිතයේ ඔබ මුහුණ දෙන අභියෝග **හතරක්** ලියන්න (ලකුණු 04)

iii.ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට පෙර සිදු වු විශේෂ සිදුවිම් අතුරෙන් ඔබට වඩාත් සමීප වු සිදුවිම වාක්‍ය **හයකින්** විස්තර කරන්න. (ලකුණු 06)

06) i.ශ්‍රි ලංකාවේ තුළ එදිනෙදා ජිවිතයේදි මිනිසා මුහුණ දෙන ව්‍යසන **දෙකක්** ලියන්න. (ලකුණු 02)

ii.බයිබලයේ සඳහන් ව්‍යසන අවස්ථාවක් හා ඒ සදහා මුල් කිතුනු සභාව කටයුතු කළ ආකාරය කරුණු **දෙකකින්** ලියන්න. (ලකුණු 04)

iii.එදිනේද්‍ර ජිවිතයේදි මුහුණ දෙන විවධ ප්‍රශ්න කරදර ඉදිරියේ දි එකිනෙකා වෙනුවෙන් කළ හැකි දේවල් **හයක්** ලියන්න. (ලකුණු 06)

07) i.ශුද්ධ බයිබලය ලියවි ඇති මුලාශ්‍ර **දෙකක්** ලියන්න. (ලකුණු 02

ii.බයිබලයක් ලබා ගැනිමට වෙහෙස මහන්සි වු දැරියගේ නම කුමක්ද? ඇයට එය ලබා දුන්නේ කවුද? (ලකුණු 04)

iii.දේව වචනය වාචික සම්ප්‍රදයෙන් මිදී ලේකනගත විම නිසා ලැබුණු ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 06)

# ක්‍රිස්තායානි ධර්මය
# 7-ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය
## I - කොටස

01

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **01** | **ii** | 02 | i | 03 | ii | 04 | iii |
| 05 | i | 06 | iii | 07 | iii | 08 | ii |
| 09 | ii | 10 | i | 11 | පර්වතය | 12 | බැටළුවා |
| 13 | ධර්මිෂ්ඨකම | 14 | භාග්‍යවන්තයකු | **15** | **වචන** | 16 | කිතුනුවන්ය |
| 17 | ළදරුවන් ය | 18 | පොත් ය | 19 | ත්‍රිපිටකයි | 20 | කුරාණයයි |

## ii කොටස

01. i. i. දරු සම්පත් ලබා වර්ධනය වීම

ii. පොළොව පුරා පැතිර එය පාලනය කිරීම

iii. භූමිය රැකගෙන එය වගා කිරීම

iv. මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගැනීම.

ii. ගස් කපා වනාන්තර එළිපෙහෙළි කිරීම

අපවිත්‍ර ජලය පිරිසිදු ගංගාවලට මුදා හැරීම

වායු දූෂණය

පරිසර දූෂණය

iii. නිවස අවට පරිසරය සුරැකිම

පාසල අවට පරිසරය පිරිසිදුව පවත්වා ගැනිම

සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරිම

.................. යනාදි ලෙස පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න

02) i. පියා- සෙකරියස් මව - එලිසබෙත්

ii. පසුතැවිලි වී සිත්හරවාගෙන බෞතිස්මය ලැබීම සඳහා (මනස්ථාපනයේ බෞතිස්මය ලැබීම).

iii. සරල ජිවිතය , සේවයට කැපවීම , යාච්ඤාව ...... යනාදි ලෙස සී ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න

03. i. ගල් පාත් කිරීමට

ii. මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේය.

iii. ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න (පෙළ පොතේ 23 පිටුව)

04. i. අයකැමියන්, රෝගීන් , කාන්තාවන්, හේවායන් , දරුවන් , දිළිදුන්

ii. මා අදහාගත් මේ බාලයන්ගෙන් එකකුවත් නොමග යවන යමෙක් වේද ඔහුගේ ගෙලවටා ඇඹරුම් ගලක් එල්ලා මුහුදු ගැඹුරෙහි ගිල්වා දැමීම ඔහුට යහපත ශු.මතෙව් 18.16

ළඳරුවන් මා වෙතට එන්නට ඉඩ දෙන්න . ඔවුන් නොවළක්වන්න. මන්ද ස්වර්ග රාජ්‍යය මෙබඳුවන්ගේය

iii.පිළිතුර අනුව ලකුණු දෙන්න.

05) i.නිහතමානිකම,සේවක නායකත්වය,උස්පහත්කම් නොබැලීම

ii.දෙමාපියාන් අහිමි වීම්.

ආර්ථික අපහසුතා

ඉගෙනිමේ අපහසුතා

අධෛර්යවීම

iii.ශුද්ධ වු සහභාගිකම , ශ්‍රවකයන්ගේ පාද සේදීම, ගෙත්සෙමනෙ යාච්ඤාව යන තුනේන් එකක් පිළිබඳ ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න. (පෙළ පොත පිටු අංක 29-34)

06) i. සුනාමි ,සුළි සුළං , භූමි කම්පා , නියඟ , ගං වතුර

ii.ක්ලෝවුඩියස් බාර්ණස් රජුගේ කාලයේ ලොව පුරා සාගතයක් ඇති විය. මුල් කිතුනු සභාවේ නායකයින් ආධාර එකතු කර බාර්ණවස් හා පාවුල් අත සභා මූලිකයන් වෙත යැවුහ.

iii.ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න . (පෙළපොත පිටු 65)

07) i.ගල් පුවරු, පැපිරස් පත්‍ර , හැකුලුම් පත්‍ර

ii. මේරි ජෝන්ස් , තෝමස් චාල්ස් මහතා

iii. (පෙළ පොත 72 පිටුව)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න